# බඩගමුව ටැම්පිට විහාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

**නවරත්න එස්.ඒ.එල්.අයි.**[1]

මහින්දාගමනයෙන් පසු ඇරඹුණු මෙරට බෞද්ධ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ඉතිහාසයෙහි ඉතා වැදගත් මෙන් ම, මහනුවර යුගයේ දී වඩාත් ප්‍රචලිත වූ ඉදිකිරීම් සම්ප්‍රදායක් ලෙස ටැම්පිට විහාර හඳුනාගත හැකි ය. ශෛලමය ටැම් මත ඉදිකරන ලද හෙයින්, ටැම්පිට විහාර යන නාමයෙන් හඳුන්වා දී තිබෙන මෙම විහාර බොහොමයක් වයඹ පළාතෙහි සුවිශේෂී ඓතිහාසික දිස්ත්‍රික්කයක් වන කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ද ස්ථානගත ව පවතී. කුරුණෑගල, තෝරයාය වසමට අයත් බඩගමුව ටැම්පිට විහාරය ද මෙම සම්ප්‍රදායට අයත් ඉතා වැදගත් විහාරයක් ලෙස හඳුන්වාදිය හැකි ය. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද අධ්‍යයනයෙහි අධ්‍යයන අරමුණ වන්නේ එම ටැම්පිට විහාරයෙන් හමුවන පුරාවිද්‍යාත්මක සාධක මොනවා ද? සහ එම සාධක මෙම විහාරයෙහි ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ දී කොතෙක් වැදගත් වුවා ද? යන්න අධ්‍යයනය කිරීම ය. මෙහි දී තොරතුරු අනාවරණය කරගැනීම සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණය යොදාගන්නා ලදී. බඩගමුව ටැම්පිට විහාරය ක්‍රි.ව. 1753 දී පමණ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උපදෙස් මත රණවන රාළ තිළමේතුමා විසින් සාදවා වැලිවිට සංඝරාජ මාහිමියන්ට පූජා කර තිබේ. සිංහල උළු සෙවිලි කරන ලද වහලයකින් සහ, කැටයම් සහිත දැවමය ලෑලි භාවිතයෙන් නිර්මිත උඩු මහලේ පිහිටුවා ඇති විහාරය, ප්‍රධාන හිඳි බුද්ධ ප්‍රතිමාවක් සහ සෙසු පිළිම වහන්සේලා කිහිපයකින් ද සමන්විත වේ. මීට අමතරව ප්‍රධාන පිළිමයට දකුණු දෙසින් විෂ්ණු දෙවියන්ගේ සිතුවමක් සහ ප්‍රධාන දොරටුව දෙපස වැලිවිට සංඝරාජ මාහිමියන්ගේ සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රූපයන් ද විචිත්‍රවත් අයුරින් චිත්‍රණය කර තිබේ. වර්තමානයේ දී සිමෙන්තියෙන් නිර්මාණය කරන ලද ටැම් 8ක් මත පිහිටන ආකාරයට මෙම ටැම්පිට විහාරය ප්‍රතිසංස්කරණය කර තිබුණත් අතීතයේ දී එය ශිලාමය වන්නට ඇත. කෙසේ වුව ද මෙම ටැම්පිට විහාරය ආශ්‍රිත ව හමුවන පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් තවත් සාධක ලෙස ප්‍රවිශ්ට දොරටුව දෙපසින් පිහිටුවා ඇති දේව ප්‍රතිමා ද්විත්වය, සීමිත වර්ණ සංඛ්‍යාවක් භාවිතයෙන් අභ්‍යන්තර බිත්තිවල සහ සිවිලිමේ චිත්‍රණය කොට ඇති විවිධ වර්ගයේ සිතුවම් සහ ලී අතුරා සකස් කරන ලද ප්‍රදක්ෂිණා පථය යනාදිය හඳුනාගත හැකි ය. මෙම අධ්‍යයනයෙන් එළඹිය හැකි අවසන් නිගමනය වන්නේ බඩගමුව ටැම්පිට විහාරය පුරාවිද්‍යාත්මක වශයෙන් ගත්කළ ඉතා වැදගත් ස්ථානයක් වන බවයි. ඒ අනුව මෙම විහාරය මතු පරපුර උදෙසා ආරක්ෂා කිරීමත්, එහි පුරාවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ තොරතුරු ජනගත කිරීමත් අත්‍යයන්තයෙන් ම සිදුකළ යුත්තකි.

**මුඛ්‍ය පද** : ටැම්පිට විහාර, බඩගමුව ටැම්පිට විහාරය, පුරාවිද්‍යාත්මක වටිනාකම, ප්‍රතිමා, සිතුවම්

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
lakmaliishara12@gmail.com